# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## තොරතුරු තාක්ෂණ සහකාර තනතුරට බඳවා ගැනීම (අභ්‍යන්තර)

- කළමනාකරුවන් විසින් ලබාදෙන මාර්ගෝපදේශ අනුව පරිගණක භාවිතයෙන් වාර්තා, ලිපි සහ අනෙකුත් ලේඛන සකස් කිරීම.
- අදාළ තොරතුරු සහ දත්ත එකතු කිරීම, විශ්ලේෂණය කිරීම සහ වාර්තා කිරීම.
- අංශ/ඒකක මගින් පවත්වාගෙන යා යුතු අන්තර්ජාලය, විද්‍යුත් තැපැල, වෙබ් අඩවි සම්බන්ධතා සහ මාර්ගගත වාර්තා සම්බන්ධ කටයුතු සිදු කිරීම .

**(2) අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්:**

අයදුම්කරු අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේදී එක් වරකදී විෂය 06ක් සමත් වී, ඉන් ඉංග්‍රීසි, ගණිතය සහ සිංහල/දෙමළ ඇතුළුව විෂය 04කට සම්මාන සාමාර්ථ ලබා තිබීම සහ අ.පො.ස . උසස් පෙළ විභාගයේදී පොදු පත්‍රය හැර විෂයයන් 03ක් සමත් වී තිබීම .

සහ

කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයක් මගින් පවත්වනු ලබන, අදාළ ක්ෂේත්‍රයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම .

සහ

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ ප්‍රාථමික (ශිල්පීය හෝ ශිල්පීය නොවන ) මට්ටමේ තනතුරක වසර 10ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම .

**(3) බඳවා ගැනීමේ පටිපාටිය**

ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක කුසලතා ප්‍රතිඵල මත බඳවා ගැනීම් සිදු කෙරේ.

<u>ලිඛිත විභාගයේ විෂයයන්:</u>

අ) භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය – පැය 2 – ලකුණු 100  
ආ) තනතුරට අදාළ විෂය දැනුම – පැය 2 – ලකුණු 100

අයදුම්කරුවන් තනතුරට බඳවා ගැනීමේ විභාගය සමත් වීමට, එක් එක් විෂය සඳහා නියම කර ඇති ලකුණු වලින් අවම වශයෙන් 40%ක් සහ සමස්ත ලකුණු එකතුවෙන් අවම වශයෙන් 50%ක් ලබාගෙන තිබිය යුතුය.

**(4) වැටුප :-** TRC 8.1 -Rs. 99,846 (10x2112) -(10x2816)-(10x3519)-(10x4223) – 226,546

**(5) පොදු කොන්දේසි**

1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ පත්කිරීම් කාණ්ඩයේ VI වන පරිච්ඡේදයේ 77 වන වගන්තිය ප්‍රකාරව මෙම පත්වීම වසරක වැඩ බලන කාලයකට යටත් වේ.
2. බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
3. අයදුම්පත් භාරගැනීම සඳහා නියම කර ඇති අවසන් දිනයට පෙර, ඉහත සඳහන් කර ඇති සියලුම අවශ්‍ය සුදුසුකම් අයදුම්කරු විසින් සම්පූර්ණ කර තිබේ නම් පමණක්, ඔහු/ඇය මෙම තනතුර සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලත් අයෙකු ලෙස සැලකේ.
4. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**(6) අයදුම් කිරීමේ ක්‍රමය:**

අවශ්‍ය මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික කළ පිටපත් සහ අංශ ප්‍රධානියාගේ නිර්දේශය සමඟ, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනයට පෙර පාලන හා ආයතනික කටයුතු අංශයට ඉදිරිපත් කළ යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2026.06.01 වේ.

**අධ්‍යක්ෂ ජනරාල්**  
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**  
**අංක .276**  
**ඇල්විටිගල මාවත**  
**කොළඹ 08**